# පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය

## I වන කොටස

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අරමුණු

1. (අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ (මෙහි මින්මතු "චර්යා ධර්ම සංග්‍රහය" යනුවෙන් හඳුන්වනු ලබන) අරමුණ වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුව සම්බන්ධයෙන්, ඔවුන්ගේ ඡන්දදායකයන් සම්බන්ධයෙන් සහ පොදුවේ මහජනයා සම්බන්ධයෙන් සිය වගකීම් ඉටු කරනු පිණිස සිය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඔවුනට සහාය වීම යි.

(ආ) (අ) අනු ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා පාර්ලිමේන්තුව විසින්-

(i) මහජන නියෝජිතයන් වශයෙන් සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් ම (මෙහි මින්මතු "මන්ත්‍රීවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) අපේක්ෂා කරනු ලබන චර්යා ධර්ම වලට අදාළ වන්නා වූ අවශ්‍ය විශිෂ්ඨතා මට්ටම සහ මූලධර්ම ස්ථාපනය කිරීම;

(ii) සෑම මන්ත්‍රීවරයෙකු විසින් ම පිළිපැදිය යුතු (අ) අනුඡේදය යටතේ ස්ථාපනය කරන ලද අවශ්‍ය විශිෂ්ඨතා මට්ටම සහ මූලධර්ම ශක්තිමත් කරනු ලබන චර්යා ධර්ම පිළිබඳ රීති නිශ්චිත වශයෙන් දැක්වීම;

(iii) මන්ත්‍රීවරුන්ගෙන් අපේක්ෂා කරනු ලබන අවශ්‍ය විශිෂ්ඨතා මට්ටම සම්බන්ධයෙන් මහජන විශ්වාසය ඇති කිරීම පිණිස සහ එම රීති ආරක්ෂා කිරීම පිණිස පාර්ලිමේන්තුවේ කැපවීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පියවර ගැනීම.

## II වන කොටස

## චර්යා ධර්ම සංග්‍රහයේ විෂයය පථය

2. (අ) මූලාසනය හොබවන මන්ත්‍රීවරුන්, අග්‍රාමාත්‍යවරයා, සභානායකවරයා, විපක්ෂ නායකවරයා, ආණ්ඩුවේ සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන් ඇතුළු එක් එක් මන්ත්‍රීවරයාට, ඔවුන්ගේ පොදු ජීවිතවල සියලු අංගයන් කෙරෙහි චර්යා ධර්ම සංග්‍රහය අදාළ වන්නේ ය. එසේ වුව ද, ඔවුන්ගේ පෞද්ගලික එම තැනැත්තන්ගේ පෞද්ගලික ජීවිතවලට මෙය අදාළ නොවන්නේ ය.

(ආ) මෙම චර්යා ධර්ම සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති වගකීම්, පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටිය හා සම්බන්ධ රීති, සභාවේ වෙනත් යම් රීති සහ මූලාසනය හොබවන මන්ත්‍රීවරුන්ගේ තීරණවලට අමතරව වන අතර, ඒවා එම රීති සහ තීරණ සමඟ සුසංගතව පැවතිය යුතු ය.

(ඇ) චර්යා ධර්ම සංග්‍රහයේ විධිවිධාන ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධාන සමඟ කියවිය යුතු ය.

(ඈ) මන්ත්‍රීවරුන්ගේ චර්යාව යම් ආකාරයකින් විධිමත් කරනු ලැබ ඇති යම් ලිඛිත නීතියක විධිවිධානවල අධිකාරය මෙම චර්යා ධර්ම සංග්‍රහයේ විධිවිධාන මඟින් හීන නොවන්නේ ය.

## III වන කොටස

## මන්ත්‍රීවරුන්ගේ කාර්ය භාරය

3. (1) වන ස්ථාවර නියෝගය යටතේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා (මෙහි මින්මතු "මහ ලේකම්වරයා" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම කරවනු ලැබීම හේතුවෙන් සෑම මන්ත්‍රීවරයෙකුටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපැදීමට සහ ආරක්ෂා කිරීමටත් රාජ්‍යයේ ඒකීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය සුරැකීමටත් වගකීමක් ඇත්තේ ය.

4. සෑම මන්ත්‍රීවරයෙකු විසින් ම මූලික අයිතිවාසිකම්වලට අදාළ නීතිය පිළිපැදිය යුතු අතර, සෑම අවස්ථාවකදී ම සිය ඡන්දදායකයන් සම්බන්ධයෙන් සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී වෙනස් ආකාරයට නොසලකන පරිදි ක්‍රියා කළ යුතු ය.

5. සෑම මන්ත්‍රීවරයකු ම සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී පොදුවේ ජාතියේ යහපත සහ විශේෂයෙන් ම සිය ඡන්දදායකයන්ගේ යහපත පිණිස ක්‍රියා කළ යුතු ය.

6. මන්ත්‍රීවරුන් සෑම අවස්ථාවක දී ම ඔවුන් වෙත තබා ඇති මහජන විශ්වාසයට අනුව ක්‍රියා කළ යුතු අතර, සෑම විටම යම් පොදු සම්පත් භාවිතය ද ඇතුළු ඔවුන්ගේ හැසිරීම අවංකභාවයකින් ඒකානුතාවයකින් විය යුතු ය.

# IV වන කොටස

## චර්යා මූලධර්ම

7. මන්ත්‍රීවරුන් සිය පොදු කටයුතු සහ පාර්ලිමේන්තු කාර්යභාරය කරගෙන යෑමේ දී පහත දැක්වෙන චර්යා මූලධර්මවලට හා අනුකූලව කටයුතු කළ යුතු ය:-

(අ) සෑම මන්ත්‍රීවරයකුට ම තීරණ ගන්නා විට, සෑම අවස්ථාවක දී ම මහජන බැඳියාවන් සැලකිල්ලට ගත යුතු අතර, ඔවුනට, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට, මිතුරන්ට හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් යම් තැනැත්තන්ට යම් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ හෝ පුද්ගලික ලාභයක් අපේක්ෂා නොකළ යුතුය;

(ආ) කිසිම මන්ත්‍රීවරයකු සිය නිල කටයුතු කිරීමේ දී තමාට බලපෑමක් ඇති විය හැකි යම් ආකාරයකට යම් පිටස්තර පුද්ගලයකු හෝ සංවිධානයකට යම් මූල්‍යමය හෝ වෙනත් බැඳීමක් ඇති වන තත්ත්වයකට පත් නොවිය යුතු ය;

(ඇ) යම් පොදු ව්‍යාපාරයක්, පොදු පත්වීම්, කොන්ත්‍රාත් ලබා දීම, යම් ප්‍රදාන හෝ වෙනත් යම් ප්‍රතිලාභ සඳහා තැනැත්තන් නිර්දේශ කිරීමට අදාළව සිය කාර්යය කර ගෙන යෑමේ දී මන්ත්‍රීවරුන් විසින් එම කටයුතු හුදෙක් කුසලතා මත කරනු ලබන බවට වගබලා ගත යුතු ය;

(ඈ) මන්ත්‍රීවරුන් විසින් මහජනතාව සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සහ ඔවුන් වෙනුවෙන් කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් වගකිව යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ ධුරයට යෝග්‍ය වන යම් පරීක්ෂාවකට හෝ යම් මහජන පරීක්ෂාවකට හෝ යටත් වන්නේ ය;

(ඉ) මන්ත්‍රීවරුන් විසින් ගනු ලබන යම් තීරණයක් හෝ කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔවුන් හැකිතාක් දුරට මහජනතාවට විවෘත විය යුතු අතර, එම තීරණවලට හේතු දැක්විය යුතු ය; තව ද, පුළුල් මහජන සුභ සිද්ධිය සඳහා අවශ්‍ය වන්නේ නම් පමණක් එම තොරතුරු සීමා කළ හැකි ය.

(ඊ) මන්ත්‍රීවරුන් විසින් සිය මහජන කටයුතුවලට අදාළ වන යම් පුද්ගලික බැඳියාවක් ඇත්නම් හෝ බැඳියාවන් සම්බන්ධ යම් ගැටීමක් ඇත්නම් ඒවා ප්‍රකාශ කළ යුතු අතර, මහජන බැඳියාවන් ආරක්ෂා වන පරිදි එසේ ඇති වන යම් ගැටීමක් නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

8. සෑම මන්ත්‍රීවරයෙකු විසින් ම ආදර්ශය තුළින් නායකත්වය ලබා දීම උදෙසා 4.1 ඡේදයේ නිශ්චිතව දක්වා ඇති චර්යා මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ සුරැකීම කළ යුතු ය.

## V වන කොටස

## චර්යා රීති

9. සෑම මන්ත්‍රීවරයෙකු ම පාර්ලිමේන්තුවේ පහත දැක්වෙන රීතිවලට අනුකූල විය යුතු යඃ-

(අ) හෘද සාක්ෂියට එකඟව කටයුතු කිරීම;

(ආ) මානව අයිතිවාසිකම්වලට සහ ජනතාවගේ නෛසර්ගික අභිමානයට ගරු කිරීම;

(ඇ) ජනතාවගේ විශ්වාසය සහ ගෞරවයට යෝග්‍ය වන පරිදි කටයුතු කිරීම;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ජීව ගුණයෙන් බැඳී සිටීම සහ බලතල බෙදීමේ න්‍යාය සහ නීතියේ ආධිපත්‍ය යන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක සංකල්ප බලාත්මක කිරීම;

(ඉ) ඔවුන් වගකීමක් දරනු ලබන ඔවුන්ගේ චර්යාව සහ කාර්යභාරය සම්බන්ධයෙන් වගකිව යුතු වීම;

(ඊ) ඔවුන්ගේ මහජන ධූරයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම යම් නීතියක් යටතේ භුක්ති විදීමට ඔවුනට හිමිකම ඇති වරප්‍රසාද නිසි ලෙස, අනලස්ව, අභිමානයෙන් යුක්තව, නිසි සැලකිල්ල ඇතිව ගෞරවයෙන් භුක්ති විදීම.

10. සෑම මන්ත්‍රීවරයෙකු ම පාර්ලිමේන්තුව ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීම සඳහා දායක වීම සම්බන්ධයෙන් පෞද්ගලිකව වගකිව යුතු වන්නේ ය.

11. සෑම මන්ත්‍රීවරයෙකු ම පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ කාර්යභාරය, ස්වාධීනත්වය, අයිතිවාසිකම් සහ වගකීම්වලට ගරු කළ යුතු ය.

12. සෑම මන්ත්‍රීවරයෙකු ම, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීමේ දී විධායකය පාර්ලිමේන්තුවට වගකිව යුතු බව සහතික කිරීමෙහිලා වගකිව යුතු ය.

13. කිසිම මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවේ හෝ එහි මන්ත්‍රීවරුන්ගේ හෝ රටේ කීර්තියට සහ ඒකාග්‍රතාවයට හානිකර විය හැකි යම් කටයුත්තක් භාර නොගත යුතු ය.

## VI වන කොටස

## මන්ත්‍රීවරුන්ගේ මූල්‍යමය බැඳියාවන් පිළිබඳ ලේඛනය සහ එම බැඳියාවන් අනාවරණය කිරීම සහ ප්‍රසිද්ධියට පත් කිරීම

14. මහ ලේකම්වරයාට කරනු ලබන ඉල්ලීමක් මත යම් මන්ත්‍රීවරයෙකුට පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි, "මන්ත්‍රීවරුන්ගේ මූල්‍යමය බැඳියාවන් පිළිබඳ ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු "ලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලේඛනයක් මහ ලේකම්වරයා විසින් අචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියකින් සහ ආකාරයෙන් තැබිය යුතු අතර පවත්වාගෙන යා යුතු ය.

15. ලේඛනයේ අඩංගු යම් තොරතුරක් ප්‍රසිද්ධියට පත් කිරීම සම්බන්ධයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

16. මන්ත්‍රීවරුන් කෙරෙහි මහජන විශ්වාසය වැඩි කරනු පිණිස මන්ත්‍රීවරුන් විසින් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ද ඇතුළු එම මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපාර සම්බන්ධතා හා මූල්‍යමය බැඳියාවන් අනාවරණය කළ යුතු ය.

17. සෑම මන්ත්‍රීවරයෙකු ම අදාළ ලේඛනයේ සිය බැඳියාවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සභාවේ නියමයන් හෘද සාක්ෂියට එකග ඉටු කළ යුතු ය. මෙම ඡේදයේ කාර්යය සඳහා මහ මැතිවරණයකට ඉක්බිතිව ම එම මන්ත්‍රීවරුන්ගේ රාජකාරී කටයුතු හා වගකීම් ද ඉඩම් සහ දේපළවලට අදාළ වත්කම්, කොටස් හිමිකාරත්වය සහ ත්‍යාග වැනි එම මන්ත්‍රීවරයාගේ පුද්ගලික බැඳියාවන් අතර බලපෑමකට තුඩු දිය හැකි යයි සාධාරණ තැනැත්තෙකු විසින් සිතිය හැකි අදාළ සියලු බැඳියාවන් පාර්ලිමේන්තුවට අනාවරණය කල යුතු ය. මේ ඡේදයේ විධිවිධාන එම මන්ත්‍රීවරයාට ලැබෙන හෝ ඔහු විසින් ප්‍රදානය කරනු ලබන යම් දේවල්වලට ද අදාළ වන්නේ ය.

18. කිසිම මන්ත්‍රීවරයෙකු විසින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අදාළ කාරණයක් සම්බන්ධ ප්‍රශ්නයක දී හැර ඔහුට යම් මූල්‍යමය බැඳියාවක් ඇති ප්‍රශ්නයක දී බෙදීමක් සහිත ඡන්ද විමසීමක දී ඡන්දය ප්‍රකාශ නොකළ යුතු ය.

19. පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක සලකා බැලීමට භාජනය වී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් මන්ත්‍රීවරයෙකුට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් පුද්ගලික හෝ මූල්‍යමය බැඳියාවක් ඇති අවස්ථාවක, එම මන්ත්‍රීවරයා විසින් එම බැඳියාව මන්ත්‍රීවරුන්ගේ අදාළ ලේඛනයේ ලියාපදිංචි කර ඇත්තේ වුව ද, එය නොතකා, එම මන්ත්‍රීවරයා විසින් එම බැඳියාවේ ස්වභාවය ප්‍රකාශ කළ යුතු අතර, ඔහු විසින් මේ ඡේදයේ නියම කොට ඇති ආකාරයට එම ප්‍රකාශය කර ඇත්නම් මිස පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක ඒ සම්බන්ධයෙන් කරනු ලබන කිසිම විවාදයකට ඔහුට සහභාගී විය නොහැකි ය.

20. කිසිම මන්ත්‍රීවරයෙකු සිය පාර්ලිමේන්තු කාර්යභාරය ඉටු කරන අතරතුර තමාට රහසිගතව ලැබුණු යම් තොරතුරක් අයුතු ලෙස පාවිච්චි නොකළ යුතු ය. එම තොරතුරු සිය පාර්ලිමේන්තු රාජකාරි කිරීමේ දී පමණක් පාවිච්චි කළ යුතු අතර, මූල්‍යමය හෝ පුද්ගලික ලාභයක් සඳහා එම තොරතුරු පාවිච්චි නොකළ යුතු ය.

21. 17 වන ඡේදය යටතේ යම් මන්ත්‍රීවරයෙකු විසින් එසේ අනාවරණය කරනු ලබන තොරතුරු සහ එක් එක් මන්ත්‍රීවරයා විසින් වියදම් පාවිච්චි කරන ලද මහජන අරමුදල්වල වියදම් ප්‍රමාණය සහ එම අරමුදල් පාවිච්චි කරන ලද කාර්යය ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පාර්ලිමේන්තුව විසින් ප්‍රසිද්ධියට පත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තු වෙබ් අඩවිය වැනි වඩාත් ප්‍රවේශ විය හැකි ආකාරයකින් එම තොරතුරු පළ කළ යුතු ය.

22. මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන අදාළ මන්ත්‍රීවරයාගේ කලත්‍රයා සහ පවුලේ සමීප සාමාජිකයන්ට ද අදාළ වන්නේ ය.

මෙම ඡේදයේ කාර්යය සඳහා "පවුලේ සමීප සාමාජිකයෙකු" යන්නෙන් පියා, මව, කලත්‍රයා, දියණිය හෝ පුත්‍රයා අදහස් වේ.

## VII වන කොටස

## මන්ත්‍රීවරුන් විසින් පොදු දේපළ පාවිච්චි කිරීම

23. මන්ත්‍රීවරුන් විසින් යම් පොදු අරමුදල්, දේපළ හෝ පහසුකම් හුදෙක් මහජන බැඳියාවක් සම්බන්ධයෙන් පමණක් නීතියෙන් අවසර දී ඇති පරිදි පාවිච්චි කළ යුතු ය. එම පොදු අරමුදල්, දේපළ හෝ පහසුකම් ඒ සඳහා නීතියෙන් විශේෂිතව විධිවිධාන සලසා ඇත්නම් මිස පක්ෂ දේශපාලන කටයුතුවලට පාවිච්චි නොකළ යුතු ය.

24. මහජන මුදලින් තමාට ලබා දෙන යම් වියදම්, පහසුකම් සහ සේවාවන් එම කාරණා සම්බන්ධයෙන් දක්වා ඇති රීතිවලට අනුකූලව වන බවට සෑම මන්ත්‍රීවරයෙකු ම වගබලා ගත යුතු ය. මන්ත්‍රීවරුන් විසින් යම් පොදු සම්පත් පාවිච්චි කිරීම සෑම විටම සිය පාර්ලිමේන්තු කාර්ය භාරය සඳහා වන බවට ද වගබලා ගත යුතු අතර, එය ඔවුන් හෝ වෙනත් අයෙකු හෝ යම් දේශපාලන සංවිධානයක අයුතු පුද්ගලික හෝ මූල්‍යමය ප්‍රතිලාභයක් සඳහා නොවිය යුතු ය.

25. පාර්ලිමේන්තුවට හෝ එහි යම් කාරක සභාවකට ඉදිරිපත් කරන ලද හෝ ඉදිරිපත් කිරීමට අදහස් කරන යම් පනත් කෙටුම්පතකට, යෝජනාවකට හෝ වෙනත් කාරණයකට එකඟ වීම හෝ විරෝධතාවය පළ කිරීම සඳහා යම් ගාස්තුවක්, වන්දියක් හෝ ත්‍යාගයක් ඇතුළු බැඳීම් සම්බන්ධ ගැටීමකට හෝ බලපෑමකට තුඩු දිය හැකි කවර හෝ ආකාරයක පෙළඹවීමක් කිසිම මන්ත්‍රීවරයෙකු විසින් භාර නොගත යුතු ය.

26. කිසිම මන්ත්‍රීවරයෙකු මුදල් ගෙවනු ලබන බලපෑම් කිරීම්, මුදල් ගෙවනු ලබන පාර්ලිමේන්තු උපදෙස් දීම හෝ මුදල් ගෙවනු ලබන උපදේශනවල නියුක්ත නොවිය යුතු ය.

27. කිසිම මන්ත්‍රීවරයෙකු විසින් ඔහු මන්ත්‍රීවරයෙකු වශයෙන් සිටීම අවසන් වූ විටක ඉදිරි සේවා නියුක්තියක් ලබා ගැනීම, මුදල් ගෙවා කරනු ලබන බලපෑම් කිරීම, උපදේශක කටයුතු හෝ වෙනත් පාරිශ්‍රමික හෝ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සිය තනතුර භාවිත නොකළ යුතු ය.

28. සෑම මන්ත්‍රීවරයෙකු ම සිය ඡන්දදායකයන්ගේ බැඳියාවන් යම් පෞද්ගලික හෝ දේශපාලනමය සබඳතා හෝ පෙළඹවීම් මත පදනම් නොවී යුක්තිසහගත පදනමක් මත නියෝජනය කළ යුතු ය.

## VIII වන කොටස

## පැමිණීම, හැසිරීම සහ ආචාරශීලිත්වය

29. සෑම මන්ත්‍රීවරයෙකු ම, අවස්ථාවෝචිත පරිදි, පාර්ලිමේන්තුවේ හෝ අදාළ මන්ත්‍රීවරයා සාමාජිකයෙකු වන යම් කාරක සභාවක අවසරය ඇතිව මිස, පාර්ලිමේන්තුවේ හෝ සෑම කාරක සභාවකම සෑම රැස්වීමක් සඳහාම පැමිණිය යුතු ය. සෑම මන්ත්‍රීවරයෙකු ම පාර්ලිමේන්තුවට පැමිණෙන විට නිසි ඇඳුමෙන් සැරසී පැමිණිය යුතු ය.

30. මන්ත්‍රීවරුන් ආචාරශීලිව කටයුතු කළ යුතු අතර, දේශපාලන කථාවල දී සහ විශේෂයෙන්ම පාර්ලිමේන්තු විවාදවල දී සුදුසු භාෂාවක් පාවිච්චි කළ යුතු ය.

31. කිසිම මන්ත්‍රීවරයෙකු යම් තැනැත්තෙකුට පහර දීම, හිරිහැර කිරීම හෝ තර්ජනය කිරීම නොකළ යුතු ය.

32. සෑම මන්ත්‍රීවරයෙකු ම සිය සාමාජික මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ද මහජනතාව ද සම්බන්ධයෙන් ගෞරවාන්විතව, ආචාරශිලිව සහ පාර්ලිමේන්තුවේ ගරුත්වයට හානි නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

## IX වන කොටස

## චර්යා ධර්ම සංග්‍රහය පිළිපැදීම

33. චර්යා ධර්ම සංග්‍රහය අදාළ කිරීම, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවට අදාළ කාරණයක් වන්නේ ය.

34. මෙම චර්යා ධර්ම සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට අනුකූලව යම් මන්ත්‍රීවරයෙකු විසින් කටයුතු කිරීමට අදාළ වන යම් කාරණා විමර්ෂණය කිරීම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් කළ හැකි ය. සෑම මන්ත්‍රීවරයෙකු ම පාර්ලිමේන්තුවේ අධිකාරය මත හෝ ඒ යටතේ පවත්වනු ලැබිය හැකි යම් විමර්ෂණයකට සෑම වේලාවක දී ම සහයෝගීතාවය දැක්විය යුතු ය. කිසිම මන්ත්‍රීවරයෙකු එම කාරක සභාවේ වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් මෙම චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම සම්බන්ධ කාරණයක් පාර්ලිමේන්තුව විසින් සලකා බැලීමේ දී යම් බලපෑමක් කරන ලෙස ගණන් ගැනෙන හෝ අදහස් කෙරෙන ආකාරයකින් කටයුතු නොකළ යුතු ය.

35. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව සිය කාර්යය ඉටු කිරීමේ දී විශේෂඥයන්ගේ සේවාව ලබා ගැනීම, ලේඛන ගෙන්වා ගැනීම, සාක්ෂිකරුවන් කැඳවීම සහ ඔවුන් විභාග කිරීම කළ හැකි ය.

36. පාර්ලිමේන්තුව විසින් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව මගින් කරනු ලබන නිර්දේශ සැලකිල්ලට ගත යුතු අතර, එම කාරක සභාව විසින් යම් මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් අවශ්‍ය යයි සලකනු ලබන දඬුවමක් සලකා බලා නිර්දේශ කළ හැකි ය.

# X කොටස

## පැමිණිලි, විමර්ශන සහ බලාත්මක කිරීම්

37. යම් මන්ත්‍රීවරයෙකු හෝ තැනැත්තකු විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යම් පැමිණිල්ලක් කළ හැකි ය:-

(අ) මන්ත්‍රීවරයෙකු විසින් කරනු ලදැ යි කියනු ලබන සදාචාර විරෝධී හැසිරීමක්;

(ආ) යම් මන්ත්‍රීවරයෙකු විසින් චර්යා ධර්ම සංග්‍රහයේ යම් විධිවිධානයක් කඩ කිරීමක්;

(ඇ) 17 වන ඡේදය යටතේ යම් මන්ත්‍රීවරයෙකු විසින් ඔහුගේ බැඳියාවන් සම්බන්ධයෙන් වැරදි හෝ සාවද්‍ය තොරතුරක් දීම සම්බන්ධයෙන්

38. යම් තැනැත්තෙකු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, එම පැමිණිල්ල මන්ත්‍රීවරයෙකු විසින් ප්‍රතිඅත්සන් කළ යුතු අතර, එය චර්යා ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුතු ය.

39. 37 වන ඡේදය යටතේ වන යම් පැමිණිල්ලක් කථානායකවරයා අමතා ලිඛිතව යෝජනාවක් ආකාරයෙන්  කළ යුතු අතර, එවිට කථානායකවරයා විසින් එම පැමිණිල්ල සුදුසු වේලාවේ දී සභාවට ඉදිරිපත් කිරීමට අදාල මන්ත්‍රීවරයාට ඉඩ දිය යුතු ය. කථානායකවරයා විසින් එවැනි යෝජනාවක් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද යෝජනා සම්මතයක් මත විභාගකොට විමර්ෂණයකොට වාර්තා කිරීම සඳහා යොමු කළ යුතු ය.

40. පැමිණිලිකරු විසින් සිය අනන්‍යතාවය ප්‍රකාශ කළ යුතු අතර, චෝදනාව සනාථ කිරීම සඳහා ලේඛනගත හෝ අන්‍යාකාරයෙන් වන උපකාරක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

41. 37 ඡේදය යටතේ මන්ත්‍රීවරයෙකු විසින් පැමිණිල්ලක් කර ඇති අවස්ථාවක දී එම පැමිණිල්ල සාවද්‍ය, නිරර්ථකාරී හෝ පීඩාකාරී නොවන බව සහ සද්භාවයෙන් කරන ලද බවට එම මන්ත්‍රීවරයා විසින් සහතික විය යුතු ය.

42. 37 ඡේදය යටතේ යම් තැනැත්තෙකු විසින් පැමිණිල්ලක් කර ඇති අවස්ථාවක දී, එම පැමිණිල්ල සාවද්‍ය, නිරර්ථකාරී හෝ පීඩාකාරී නොවන බව සහ සද්භාවයෙන් කරන ලද එකක් බවට එම තැනැත්තා විසින් සහතික විය යුතු ය. ඒ බව පෙන්නුම් කරනු ලබන දිව්රුම් ප්‍රකාශයක් පැමිණිල්ල සමඟ තිබිය යුතු ය.

43. 37 ඡේදයේ දැක්වෙන යම් මන්ත්‍රීවරයෙකු හෝ තැනැත්තෙකු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් අවශ්‍ය සහ නියම කරනු ලබන යම් අවස්ථාවක එම පැමිණිල්ල සාවද්‍ය, නිරර්ථකාරී හෝ පීඩාකාරී නොවන බව සහ එය සද්භාවයෙන් කරන ලද බව එම කාරක සභාව සෑහීමට පත් වන ලෙස ඔප්පු කළ යුතු ය.

44. 37 ඡේදය යටතේ වන සෑම පැමිණිල්ලක් ම ගෞරවාන්විත භාෂාවෙන් ලිවිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, එම මන්ත්‍රීවරයා හෝ තැනැත්තා විසින් එය අත්සන්කොට තිබිය යුතු ය.

45. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් හුදෙක් තහවුරු නොකරන ලද යම් මාධ්‍ය වාර්තාවක් පදනම් කරගත් පැමිණිල්ලක් භාර නොගත යුතු ය.

46. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් අධිකරණයේ විනිශ්චයට භාජනය වී ඇති යම් කාරණයක් සලකා බැලීම නොකළ යුතු අතර යම් කාරණයක් අධිකරණයේ විනිශ්චයට භාජනය වී තිබේ ද නොතිබේ ද යන්න සම්බන්ධයෙන් කාරක සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

## XI කොටස

## පරීක්ෂණ සඳහා කාර්ය පටිපාටිය සහ දඩුවම්

47. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද පැමිණිල්ල නියමිත ආකෘතියේ ඇති බවට සහ එහි සඳහන් කාරණය සිය අධිකාර බලය යටතේ පවතින කාරණයක් බවට එම කාරක සභාව සෑහීමට පත් වේ නම්, එම පැමිණිල්ල පාර්ලිමේන්තුව විසින් පරීක්ෂා කිරීම සඳහා භාරගනු ලැබිය හැකි ය.

48. මූලික පරීක්ෂණයෙන් පසුව බැලූ බැල්මට පෙනෙන නඩුකරයක් නොමැති බව එම පරීක්ෂණයෙන් අනාවරණය වේ යයි එම කාරක සභාව අදහස් කරයි නම් එවැනි පැමිණිල්ලක් නොසලකා හැරිය යුතු ය.

49. යම් පැමිණිල්ලක් සාවද්‍ය, නිරර්ථකාරී හෝ පීඩාකාරී වන බව සහ පැමිණිල්ල අසද්භාවයෙන් කර ඇති බව සොයා ගනු ලබන යම් අවස්ථාවක, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් එම පැමිණිල්ල පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීමක් ලෙස සලකා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කළ හැකි ය.

50. මූලික පරීක්ෂණයෙන් පසුව බැලූ බැල්මට පෙනෙන නඩුකරයක් ඇති බව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් සලකනු ලබන්නේ නම් එම කාරණය විභාග කොට ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

51. සෑම මන්ත්‍රීවරයෙකු ම 37 ඡේදය යටතේ යොමු කරන ලද යම් පැමිණිල්ලක් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් විමර්ෂණය කිරීමේ දී සහ පරීක්ෂා කිරීමේ දී ඒ සඳහා එම කාරක සභාව සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කළ යුතු අතර එයට සහාය විය යුතු ය.

52. අපරාධ නීතියට අදාළ යම් කඩ කිරීමක් පවතින බව යම් සාක්ෂිවලින් පෙනී යයි නම් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් වහාම එම කාරණය පොලිස් ස්ථානයට ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා අධිකරණ බලය ඇති වෙනත් යම් ආයතනයකට යොමු කළ යුතු ය.

53. එම කාරණය විමර්ෂණය කිරීමෙන් සහ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් සොයා ගනු ලබන කරුණු හෝ එහි නිර්දේශ එම කාරක සභාවේ රීතිවලට අනුකූලව ඉදිරි කටයුතු සඳහා සභාවට වාර්තා කළ යුතු ය.

54. මන්ත්‍රීවරයෙකු යම් සදාචාර විරෝධි හැසිරීමක නිරත වූ බව හෝ එම මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් වෙනත් යම් විෂමාචාරයක් ඇති බව හෝ යම් මන්ත්‍රීවරයෙකු චර්යා ධර්ම සංග්‍රහයේ යම් විධිවිධානයක් කඩ කර ඇති බව හෝ සොයා ගනු ලැබූ අවස්ථාවක, එම මන්ත්‍රීවරයාට පහත සඳහන් දඩුවම්වලින් එකක් හෝ කීපයක් පනවන ලෙස ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් සභාවට නිර්දේශ කළ හැකි ය:-

(අ) දෝෂාරෝපණය;

(ආ) තරවටු කිරීම;

(ඇ) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාවක් දක්වා පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගි වීම අත්හිටුවීම; එසේ වුව ද, එම කාලසීමාව 1978 අංක 5 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ දක්වා ඇති සීමාවන් නොඉක්ම විය යුතු ය; සහ

(ඈ) ඉහත කී පනත යටතේ පාර්ලිමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර ඇති කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඩුවමක්.

## XII වන කොටස

## වාර්තා පිළිගැන්වීම සහ සලකා බැලීම

55. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ වාර්තාව එහි සභාපතිවරයා විසින් හෝ ඔහු පැමිණ නොමැති නම් එම කාරක සභාවේ වෙනත් යම් සාමාජිකයෙකු විසින් සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

56. වාර්තාව සලකා බැලීම සඳහා වන යෝජනාවක් සම්මත වූ පසු, අවස්ථාවෝචිත පරිදි, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හෝ එහි යම් සාමාජිකයෙකු හෝ වෙනත් යම් මන්ත්‍රීවරයෙකු විසින් එම වාර්තාවේ නිශ්චිතව දක්වා ඇති නිර්දේශ සමඟ සභාව එකඟ වන්නේ ද එකඟ නොවන්නේ ද නැතහොත් වාර්තාවට කරනු ලබන සංශෝධන ද සමඟ එයට එකඟ වන්නේ ද යන්න යෝජනා කළ යුතු ය.

## XIII වන කොටස

## චර්යා ධර්ම සංග්‍රහය සෑදීම සහ යථාවත් කිරීම

57. චර්යා ධර්ම සංග්‍රහය සුදුසු තත්ත්වයේ පවතින බවටත්, කලින් කල, එය සමාලෝචනය සහ ප්‍රතිශෝධනය කොට අවශ්‍ය විටෙක සංශෝධනයකොට යථාවත් කරනු ලබන බවටත් එහි විධිවිධාන මන්ත්‍රීවරුන්ට හුරුපුරුදු බවටත් පාර්ලිමේන්තුව විසින් වගබලා ගත යුතු ය.

58. මෙම චර්යා ධර්ම සංග්‍රහය, පාර්ලිමේන්තුවේ තීරණයකින් පසුව ක්‍රියාත්මක විය යුතු ය.